දළ වශයෙන් ලෝකයේ සමස්ත ජනතාවගෙන් 15% ක පමණ කොටසක් යම් කිසි ආකාරයක ආබාධ සහිත බවක් සමගින් ජීවත් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2020 සඳහා වන සංඛ්‍යාලේඛන ඔස්සේද සඳහන් වේ. එනිසාම, ආබාධ සහිතව ජීවත් වන අයගේ ආබාධය සම්බන්ධයෙන් නොව, එම පුද්ගලයා සම්බන්ධයෙන් සහකම්පනය දැක්වීම අවශ්‍ය වේ. ආබාධ සහිත අය සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පවා එම පුද්ගලයා සම්බන්ධයෙන් සහකම්පනය දැක්විය යුතු බව හඳුනා ගැනීම වැදගත් වේ.

ආබාධ සහිත වූවන්ව හැඳින්වීමේදී ආබාධය නොව පුද්ගලයාව මුල් කොට ගත් භාෂාවක් (Person-first language) යොදාගැනීම වඩාත් යෝග්‍ය බව අදාළ මාර්ගෝපදේශනයන්හි දැක්වෙන්නේද ඒ හෙයිනි. එම පුද්ගල මූලික භාෂාවකට අනුව, 'ආබාධිත' යන යෙදුම වෙනුවට 'ආබාධ සහිත' යන යෙදුම වඩාත් යෝග්‍ය නොවන්නේදැයි අප ඇසිය යුතු වේ. එසේ නැතිනම් පුද්ගලයාව මුල් කොට ගත් භාෂාවට අනුව එසේ භාවිතා කළ හැකි වඩාත් යෝග්‍ය වෙනත් යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:

https://www.who.int/docs/default-source/documents/disability/world-report-on-disability-factsheet.pdf?sfvrsn=2a22ed1e_2

http://www.disability.wa.gov.au/Global/Publications/Understanding%20disability/words_that_work_media_guide.pdf

https://adata.org/factsheet/ADANN-writing

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbma #Divaina